# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.04.23 පැය 1015 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out /816/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2025.04.22 වන දින සවස් කාලයේ කැස්බෑව පොලිස් වසමේ සමරවිල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 250 ක්, හෙරොයින් ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 630 ක්, විද්‍යුත් තරාදියක් හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැකකරන මුදල් රුපියල් 3,000/= ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන කැස්බෑව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු හිටපු සංවිධානාත්මක අපරාධකරුවෙකු හා මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු සමඟ සම්බන්ධතා පවත්වනු ලැබූ දැනට විදේශගතව සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකුගේ මෙරට මත්ද්‍රව්‍ය ජාලයේ මත්ද්‍රව්‍ය බෙදාහරිනු ලබන ජාමාජිකයෙකු බවට දැනට සිදුකරන ලද විමශර්ණයේ දී අනාවරණය වී ඇත. කැස්බෑව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා ගෝනහේන කඳවුර.**

2025.04.22 වන දින සවස් කාලයේ ගණේමුල්ල පොලිස් වසමේ අමුණුගම මාගර්යේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අයිස් මත්ද්‍රව්‍ය සන්තකයේ තබාගනිමින් යතුරුපැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 760 ක්, යතුරුපැදිය හා ජංගම දුරකථනයක් ද සමඟින් අත්අඩංගුවට** ගෙන ගම්පහ කොට්ඨාස අපරාධ විමශර්න කාය‌ර්ංශය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන පරකන්දෙණිය, ඉඹුල්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ කොට්ඨාස අපරාධ විමශර්න කාය‌ර්ංශය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

03. **අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුර.**

2025.04.22 වන දින සවස් කාලයේ කිරිදිවැල පොලිස් වසමේ කිරිදිවැල පොල පාර අසලදී පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 940 ක්, හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 650 ක්, ජංගම දුරකථනයක් හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් රුපියල් 11,300/= ක් ද යතුරුපැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන කිරිදිවැල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 36 හා 37 වයස්වල පසුවන කිරිදිවැල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කිරිදිවැල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

04. **නීති විරෝධී දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2024.04.22 වන දින රාත්‍රී කාලයේ ගලේවෙල පොලිස් වසමේ ජයතිලක මාවතේදී පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි 6000 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ගලේවෙල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන ගලේවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගලේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

05. **අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.**

2025.04.22 වන දින දහවල් කාලයේ වාලච්චේන පොලිස් වසමේ වාලච්චේන ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 700 ක් හා යතුරුපැදි 01 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වාලච්චේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන බිරන්දච්චේන, වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

06. **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුර.**

2025.04.22 වන දින උදෑසන කාලයේ කරදියනාරු පොලිස් වසමේ රූගම වැව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන කරදියනාරු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන රූගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කරදියනාරු පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කල සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුර.

2025.04.22 වන දින සිලාවතුර පොලිස් වසමේ මරදමඩු ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලනකුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීම් 03 ක් සිදුකර **බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ට්‍රැක්ටර් රථ 03 කට පටවමින් සිටි සැකකරුවන් තිදෙනෙකු ට්‍රැක්ටර් රථ 03 ද සමග අත්අඩංගුවට** ගෙන සිලාවතුර අධිවිවන කායර්ාලය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21, 22 හා 28 යන වයස්වල පසුවන මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සිලාවතුර අධෙවිවන කායර්ාලය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**